සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

13445

| ශ්‍රේණිය / தரம் / Grade | 10 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය / நேரம் / Time | පැය 3 යි |
|---|---|---|---|---|

නම / பெயர் / Name ..........................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................................

# I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

අමතර කියවීම් කාලය වි.10

1. සිදුහත් බෝසතාණන් වහන්සේට ශිල්ප ශාස්ත්‍ර ඉගැන් වූ බමුණු පඬිවරයා වූයේ.
   I. අසිත තවුසා ය.
   II. ආලාරකාලාම තවුසා ය.
   III. සංජය පිරිවැජියා ය.
   IV. සර්වමිත්‍ර පඬිවරයා ය.
2. ස්වයංවරය නමැති සිරිතට අනුව සිදුහත් කුමරු සරණ පාවාගත් යශෝධරා කුමරියගේ පියා වූයේ.
   I. සුප්‍රබුද්ධ රජු ය.
   II. කොසොල්රජු ය.
   III. බිම්බිසාර රජු ය.
   IV. උදේනි රජු ය.
3. මනා වූ පිළිවෙත් පුරනු ලබන බැවින් මහා සංඝරත්නය,
   I. දක්ඛිණෙය්‍ය නම් වෙයි.
   II. සුපටිපන්න නම් වෙයි.
   III. උජුපටිපන්න නම් වෙයි.
   IV. පාහුණෙය්‍ය නම් වෙයි.
4. දැනට ලොව ඇති පැරණිම පැවිදි සංවිධානය වූ සංඝරත්නය ලොව පහළ වූයේ,
   I. වෙසක් පෝය දාය.
   II. ඇසළ පෝය දා ය.
   III. උඳුවප් පෝය දා ය.
   IV. බිනර පෝය දා ය.
5. පංචනීවරණ ධර්ම වල බොරවූ ජලයට උපමා කර ඇති නීවරණය නම්,
   I. විචිකිච්ඡාව.
   II. ථීන මිද්ධ.
   III. ව්‍යාපාදය.
   IV. කාමච්ඡන්දය.
6. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශීල ශික්ෂාවට අයත් මාර්ගාංගයක් වන්නේ,
   I. සම්මා සමාධි.
   II. සම්මා සංකප්ප.
   III. සම්මා වායාම.
   IV. සම්මා කම්මන්ත.
7. සැපදුක් හා මැදිහත් වීදීම් ඇස - කන ආදී ඉඳුරන් ට රූප ශබ්දාදි අරමුණු හමු වූ විට සිතෙහි ඇති වන වින්දනය,
   I. රූප ස්කන්ධයයි.
   II. සඤ්ඤා ස්කන්ධයයි.
   III. සංඛාර ස්කන්ධයයි.
   IV. වේදනා ස්කන්ධයයි.
8. සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති පරිදි ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටුකළ යුතු යුතුකම් ලෙස දක්වා නොමැත්තේ,
   I. මැනවින් ඉගැන්වීම.
   II. මැනවින් හික්මවීම.
   III. අවමන් නොකිරීම
   IV. ශිෂ්‍යයා ආරක්ෂා කර ගැනීම.
9. පුද්ගලයාට වැළඳෙන විවිධාකාර රෝග සඳහා හේතු වන කරුණු 08ක් දක්වා ඇති සූත්‍ර දේශනාව වන්නේ,
   I. චූල්ලකම්මවිභංග සූත්‍රය.
   II. පරාභව සූත්‍රය.
   III. ගිරිමානන්ද සූත්‍රය.
   IV. රතන සූත්‍රය.
10. බුදුදහමේ සිත දියුණු කිරීමේ පදනම වන්නේ,
   I. ප්‍රඥාවයි.
   II. සමාධියයි.
   III. සීලයයි.
   IV. ශ්‍රද්ධාවයි.

11. "දුස්සීල ව නොසන්සුන් සිත් ඇති ව අවුරුදු සියක් ජීවත් වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව එක් දවසක් ජීවත්වීම ශ්‍රේෂ්ඨය" යනුවෙන් දක්වා ඇති ධම්මපද ගාථාවේ පළමු පද පේළිය වන්නේ,
   I. යෝ ච වස්සසතං ජීවෙ.
   II. ආරභථ නික්ඛමථ
   III. සුසුඛං වත ජීවාම
   IV. යාදිසං වපතේ බීජං

12. සත්ත්වයන් උස් පහත් වශයෙන් බෙදනු ලබන්නේ කර්මය විසින් බව බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද්දේ,
   I. දෝණ බමුණා ට ය.
   II. සුභ මාණවකයාට ය.
   III. සංජය පිරිවැජියාට ය.
   IV. උපාලි ගෘහපතියාට ය.

13. ජනක කර්මයේ විපාක දීමේ හැකියාව නැති කොට තමාට ම විපාක ලබාදෙන කර්මය නම්,
   I. ආචිණ්ණ කර්ම.
   II. උපපීඩක කර්ම.
   III. උපත්ථම්භක කර්ම.
   IV. උපඝාතක කර්ම.

14. ත්‍රිවිධ රත්නයේ ගුණ ශිෂ්‍ය ජීවිතයේ සාර්ථකත්වයට උපයෝගී කර ගැනීමට හැකි වන්නේ එම ගුණ ධර්ම ,
   I. පරිනායනය කිරීමෙනි.
   II. කටපාඩම් කිරීමෙනි.
   III. පොතපතේ ලිවීමෙනි
   IV. ශබ්ද නගා කියවීමෙනි.

15. බුදු දහමට අනුව පරම ලාභය ලෙස දක්වා ඇත්තේ,
   I. විශ්වාසය.
   II. නිරෝගී කම.
   III. නිවන.
   IV. සතුට.

16. බුදුන් වහන්සේ දහතුන, දහ අට, දහ නවය යන වස්කාල ගත කරපු ලැබුවේ,
   I. මකුල පර්වතයේ.
   II. චාලිය පර්වතයේ.
   III. භේෂකලා පර්වතයේ.
   IV. ගිජ්ජකූට පර්වතයේ.

17. දුක්ඛ යන බුද්ධ වචනයට ලබාදිය හැකි ගැඹුරු අර්ථයක් නොවන්නේ,
   I. අසාර බව.
   II. තුච්ඡ බව.
   III. කුසීත බව.
   IV. අර්ථ ශූන්‍ය බව.

18. බුදුවරයෙකු ලොව පහළවන්නේ උත්තරීතර පරම සත්‍ය මිනිස් වර්ගයාට දේශනා කිරීමට ය. එම පරම සත්‍යය නම්,
   I. ත්‍රිලක්ෂණයයි.
   II. කර්මයයි.
   III. පටිච්චසමුප්පාදයයි.
   IV. චතුරාර්ය සත්‍යයයි.

19. යස ඉසුරින් පිරුණු ස්ථානයක උපත ලැබීම හේතුකොටගෙන අකුසල කර්මයන්හි විපාක දීම වැළකී යන්නේ.
   I. ගති සම්පත්තිය නිසා ය.
   II. කාල සම්පත්තිය නිසා ය.
   III. ප්‍රයෝග සම්පත්තිය නිසා ය.
   IV. උපධි සම්පත්තිය නිසා ය.

20. "ඉමස්මිං අසති ඉදං න හොති" යන්නෙහි අර්ථය වන්නේ,
   I. මෙය ඇති කල්හි මෙය වෙයි.
   II. මෙය නැති කල්හි මෙය නොවෙයි.
   III. මෙය උපදීමෙන් මෙය උපදී
   IV. මෙය නැති වීමෙන් මෙය නැති වී යයි.

21. බොදු දරුවෙකු වන අපගේ යුතුකමක් වන්නේ,
   I. තම දියුණුව පමණක් සිතීමයි.
   II. අන්‍ය ආගමික අදහස් වලට එරෙහි වීමයි.
   III. සහජීවනයෙන් කටයුතු කිරීමයි.
   IV. තම මතය පමණක් පිළිගැනීමයි.

22. සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති යුතුකම් ගණන වනුයේ,
   I. 60කි.
   II. 55කි.
   III. 61 කි
   IV. 38කි.

23. බුදුන් වහන්සේ විසින් පමණ ඉක්මවා ආහාර ගැනීමේ අහිතකර බව පැහැදිලි කර දුන් රජතුමා වන්නේ,
   I. බිම්බිසාර රජු.
   II. අජාසත් රජු.
   III. සුද්ධෝදන රජු.
   IV. කොසොල් රජු.

24. සතර මහා භූත රූප වල "තේජෝ" ධාතු යනු,
   I. උෂ්ණ හා සිතල ස්වභාවයයි.
   II. සෙලවෙන ස්වභාවයයි.
   III. තද ස්වභාවයයි.
   IV. වැගිරෙන සභාවයයි.

25. සීලයෙන් යුතු ව සමාධි භාවනාව සඳහා යොමු වීමේදී පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
   I. සන්තුට්ඨිතා.
   II. ධර්ම ශ්‍රවණය.
   III. ඉන්ද්‍රිය සංවරය.
   IV. සති සම්පජඤ්ඤ



CS CamScanner

26. මම නිත්‍ය වශයෙන් දිගින් දිගටම සසර සැප විඳිමි යන අපේක්ෂාව,
   I. භව තණ්හාවයි.
   II. කාම තණ්හාවයි.
   III. වස්තු තණ්හාවයි.
   IV. විභව තණ්හාවයි.

27. "සත්හට වන බව දුනට වෙදාණන්" මෙම කවිය තුළ ග්‍රන්ථය වන්නේ,
   I. සුභාෂිතය.
   II. බුදුගුණඅලංකාරය.
   III. කාව්‍යශේඛරය.
   IV. ලෝවැඩ සඟරාව

28. කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පවත්වා ඇති ධර්ම සංගායනාව වන්නේ,
   I. සිව්වන ථෙරවාදී සංගායනාව.
   II. කණිෂ්ක ධර්ම සංගායනාව.
   III. තෙවන ධර්ම සංගායනාව.
   IV. ප්‍රථම ධර්ම සංගායනාව.

29. ධාන්‍යාකාර හැඩිති ස්තූපයක ට උදාහරණයක් වන්නේ,
   I. ථූපාරාමය ස්තූපය.
   II. කැලණි විහාරයේ ස්තූපය.
   III. මහියංගණ ස්තූපය.
   IV. අභයගිරි ස්තූපය.

30. ඇතැම් ස්තූපවල ගර්භයට සම්බන්ධ සිව් දිශාවට මුහුණලා තනන ලද අලංකාර තොරණක් වැනි නිර්මාණය,
   I. වාහල්කඩයි.
   II. වටදාගෙයයි.
   III. මුරගලයි
   IV. තොරවක්ගලයි.

31. කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහයෙන් පැවැති කණිෂ්ක ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය පැවැරුණේ,
   I. වසුමිත්‍ර හිමියන්ට.
   II. සබ්බකාමී හිමියන්ට.
   III. පාර්ශ්ව තෙරුණ්ට.
   IV. මහා කාශ්‍යප හිමියන්ට

32. පොළොන්නරු යුගයේ පැරණිම සිතුවම් පැවති ස්ථාන ලෙස සැලකිය නොහැක්කේ,
   I. මහියංගණ ස්තූපයේ ධාතු ගර්භය.
   II. තිවංක පිළිම ගෙය.
   III. දිඹුලාගල ලෙන්.
   IV. බොරැල්ල ගෝනමි විහාරය.

33. අනුරාධපුර සාහිත්‍ය යුගයට අයත් ග්‍රන්ථයන් වන්නේ,
   I. සියබස්ලකර.
   II. අමාවතුර.
   III. පූජාවලිය.
   IV. ධර්ම ප්‍රදීපිකාව.

34. සිල් රැකීමෙන් මෙලොව දී ලැබිය හැකි ආනිසංස ගණන වනුයේ,
   I. 5කි.
   II. 6කි.
   III. 3කි.
   IV. 4කි.

35. අස්සජි මහරහතන් වහන්සේ විසින් උපතිස්ස පිරිවැජියා ට දේශනා කරන ලද ධර්මය වූයේ,
   I. ත්‍රිලක්ෂණයයි.
   II. හේතුඵල දහම යි.
   III. මධ්‍යම ප්‍රතිපදාවයි.
   IV. චතුරාර්ය සත්‍යයයි.

36. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතයට අනුව සඳකඩ පහණින් අර්ථවත් වනුයේ,
   I. භව චක්‍රය.
   II. අටලෝ දහම.
   III. අනිත්‍යතාව
   IV. සදෙව් ලොව.

37. නිවන් මගෙහි යාමට අපට අවශ්‍ය මග වියදම් සපයනු ලබන්නේ,
   I. පංචශීලයයි.
   II. ප්‍රඥාවයි.
   III. වීර්යයයි.
   IV. ශ්‍රද්ධාවයි.

38. මාස ගණනක් බුදුන් වහන්සේ සමග එකට සිටිමින් උන්වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කොට බැලුවේ,
   I. ආනන්ද හිමි.
   II. බ්‍රහ්මායු නම් බමුණා.
   III. වක්කලී හිමි.
   IV. ද්‍රෝණ බමුණා.

39. බුදු දහම අනුව පුද්ගලයාගේ රූපය උපමා කර ඇත්තේ,
   I. දිය බුබුලකටය.
   II. මිරිඟුවකට ය
   III. පෙණ පිඩකට ය.
   IV. කෙසෙල් කඳකට ය.

40. බුදුන් වහන්සේ විසින් සිත්කලු ස්ථාන වශයෙන් හැඳින්වූ උදේන, ගෝතමක, සාරන්දද යනාදි චෛත්‍ය පිහිටියේ,
   I. රජගහනුවරය.
   II. විශාලා මහනුවරය.
   III. කුසිනාරානුවරය.
   IV. සැවැත්නුවරය.



CamScanner

# II පත්‍රය

පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

1. i. සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමරුට ඉදි කරවා දුන් මාළිගා තුන කුමක්ද?
   ii. බුදු දහමේ දැක්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.
   iii. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමියන් විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
   iv. පද්ම උපමාවට අනුව බුදුරදුන් වදාළ ත්‍රිවිධ පුද්ගලයින්ගෙන් දෙදෙනෙක් නම් කරන්න.
   v. දෙයාකාර වූ ශ්‍රද්ධාව නම් කරන්න.
   vi. "සමවායෝ එව සාධු" මෙහි අර්ථය ලියන්න.
   vii. බුදුරජාණන් වහන්සේ අරහං නම් වන්නේ කුමන කරුණු නිසාද?
   viii. පොළොන්නරු යුගයේ රචිත පැරණිතම ගී කාව්‍ය දෙක කුමක්ද?
   ix. ශිෂ්ට ලෙස ආහාර අනුභව කරන්නන් පස්දෙනකු ගැන බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන්ය ඉන් දෙදෙනකු නම් කරන්න
   x. බෝධිසරය යන්න හඳුන්වන්න.

2. i. සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවාද?
   ii. සිදුහත් බෝසතුන්ට මුහුණ දීමට සිදු වූ අභියෝග තුනක් නම් කරන්න.
   iii. ශිෂ්‍ය ජීවිතයේ අභියෝග ජය ගැනීමට බෝසත් සිරිත චරිතායනය කළ හැකිය විස්තර කරන්න.

3. i. උට්ඨානවතෝ සතිමතෝ ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න
   ii. එම ගාථාවේ තේරුම ලියන්න
   iii. දියුණුවට පත් ව තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට ඉහත සඳහන් ධම්මපද ගාථාවෙන් ලබා දෙන හැකියාවන් හා ගුණාංග විස්තර කරන්න.

4. i. සිගාලෝවාද සූත්‍රය හිතමිතුරන් හා ස්වාමි භාර්යාවන් දක්වා ඇති දිශා දෙක පිළිවෙලින් නම් කරන්න
   ii. පැවිදි පක්ෂය විසින් හය ආකාරයකින් ගිහියන්ට සංග්‍රහ කළ යුතු යැයි සිගාලෝවාද සූත්‍රයේ දැක්වේ ඉන් යුතුකම් තුනක් ලියන්න.
   iii. පුද්ගලයාගේ දියුණුවට සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති යහළු මිත්‍ර යුතුකම් ඉවහල් කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න

5. i. බෞද්ධ රාජ්‍ය පරිපාලන ප්‍රතිපත්ති දෙකක් නම් කරන්න
   ii. ඉන් එක් පරිපාලන ප්‍රතිපත්තියක් කෙටියෙන් දක්වන්න
   iii. සියලු රට වැසියන්ට හිතකර වූ පාලනයක් පවත්වාගෙන යාමට බෞද්ධ රාජ්‍ය පරිපාලන ප්‍රතිපත්ති වහල් කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න

6. i. සිව්වැනි ථේරවාදී ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු දෙකක් නම් කරන්න
   ii. එම ධර්ම සංගායනාව පැවැත්වූ කාලය ස්ථානය හා අනුග්‍රහය දැක්වූ අය ලියන්න
   iii. සිව්වැනි ථේරවාදී ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසන ඉතිහාසයේ ඉතිහාසය කෙරෙහි බලපෑ අයුරු පැහැදිලි කරන්න

7. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න
   i. දුටුගැමුණු රජතුමා
   ii. ස්තූපය
   iii. කච්සිළුම්ණ
   iv. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade — 10 ශ්‍රේණිය | **බුද්ධ ධර්මය** | කාලය / நேரம் / Time — පැය 3 යි |

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 - 1 | 02 - 1 | 03 - 4 | 04 - 4 | 05 - 1 | 06 - 3 |
| 07 - 4 | 08 - 3 | 09 - 4 | 10 - 1 | 11 - 4 | 12 - 2 |
| 13 - 2 | 14 - 4 | 15 - 2 | 16 - 3 | 17 - 1 | 18 - 1 |
| 19 - 4 | 20 - 3 | 21 - 3 | 22 - 4 | 23 - 2 | 24 - 3 |
| 25 - 3 | 26 - 4 | 27 - 4 | 28 - 2 | 29 - 3 | 30 - 2 |
| 31 - 3 | 32 - 1 | 33 - 2 | 34 - 1 | 35 - 1 | 36 - 2 |
| 37 - 4 | 38 - 3 | 39 - 2 | 40 - 3 | | |

01. (i) මහල්ලෙක් - ලෙඩෙක් - මළමිනියක් - පැවිදි රුවක්

(ii) රහසත් පවු නොකොට - කෙලෙසරයනුත් දුරු කොට - නිසි වුයෙන් පුදට - අරහ යැයි නම කියති මුනිඳුට

(iii) ඉන්ද්‍රිය සංවරය (ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රිය සංවර කිරීම).

සති සම්පජඤ්ඤ (හිඳීම, සිටීම, ඇවිදීම ආදි සියලු ක්‍රියාවන්හි දී අවබෝධයෙන් යුතුවීම).

සන්තුට්ඨිතා (ලද දෙයින් සතුටු වීම)

(iv) පඤ්චාභිඥා හා අෂ්ට සමාපත්ති උපදවා ගැනීම.

(v) අනිත්‍ය දුක්ඛ අනාත්ම

(vi) ස්වාක්ඛාතෝ - සන්දිට්ඨිකෝ, අකාලිකෝ, ඒහි පස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති.

(vii) සමගිවන්න විවාද නොකරන්න.

(viii) 1. ජනක කර්ම 2. උපත්ථම්භක කර්ම

3. උපපීඩක කර්ම 4. උපඝාතක කර්ම

(ix) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප

(x) මහාසෑය, මිරිසවැටිය, ලෝවාමහා ප්‍රාසාදය (ලකුණු $2 \times 10 = 20$)

02. (i) සමථ, විදර්ශනා

(ii) "චිත්තං සමේතීති සමථෝ" සිත සන්සුන් කරන්නේ සමථයයි.

(iii) ලෝභ, ද්වේශ, මෝහ ආදී කෙලෙස් සිතුවිලි පාලනය වේ. ධාරණ ශක්තිය වැඩි වේ. පොත පත පාඩම් කිරීමේදී වෙනදාට වඩා පහසුවක් දනේ, සිතෙහි තෘප්තිමත් ස්වභාවයක් ඇති වේ. අසහනය නැති වී ප්‍රසන්න පෙනුමක් ඇති වේ. කායික රෝග පීඩා අඩු වීමෙන් නිරෝගී වේ. සිත විසිරී යාමට නොදී එකඟ කර ගැනීමට උපකාරී වේ.

පිළිතුරු ගලපා ලකුණු දෙන්න. (ලකුණු - 2+3+5 = 10)

03. (i) අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජාචරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරපුරිසදම්ම සාරථී, සත්ථා දේව මනුස්සානං, බුද්ධෝ, භගවා.

(ii) කළ යුතු හා නොකළ යුතු දේ

(iii) පාවහන් හිස් වැසුම් ගැලවීමාදියත්, වතාවත් කිරිම් ආදිය පිළිබඳ සෑහෙන පිළිතුරක් ලිවීම අපේක්ෂිතයි. (ලකුණු - 2+3+5 = 10)

04. (i) උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්ම කාරිනෝ
සඤ්ඤතස්සච ධම්මජීවිතෝ - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

(ii) කරුණු හත ඇතුළත්ව අර්ථය ලියා තිබීම.
උට්ඨානවතෝ - උත්සහවන්ත බව, සතිමතෝ - එළඹ සිටි සිහිය,
සුචිකම්ම - පිරිසිදු ව කටයුතු කිරීම, නිසම්මකාරී - නුවණින් පිරික්සා කටයුතු කිරීම,
සඤ්ඤත - දමනය වීම, ධම්මජීව - දැහැමි ව ජීවත් වීම, අප්පමත්ත - අප්‍රමාදය

(iii) නිදසුන් කිහිපයක් සමඟ පිළිතුරු ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(ලකුණු - 2+3+5 = 10)

05. (i) ක්‍රි.පූ. පළමු වැනි සියවසේ ලංකාවේ මාතලේ අලුවිහාරයේ දී

(ii) 10 ශ්‍රේණියේ බුද්ධ ධර්මය පෙළ පොතෙහි 103 - 104 - 105 පිටු බලන්න.

(iii) 10 ශ්‍රේණියේ බුද්ධ ධර්මය පෙළ පොතෙහි 103 - 104 - 105 පිටු බලන්න.
(ලකුණු - 2+3+5 = 10)

06. (i) චීවර පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස

(ii) ආහර හත්ථක, අලංසාටක, තත්ථාවට්ටක, කාකමාසක, භුත්තවම්තක

(iii) පහත කරුණු එක් කොට පිළිතුරු ලියා ඇත්නම් ලකුණු දෙන්න.

- ආහාර ළං කිරීමට කලින් ම මුඛය විවෘත කිරීම.
- ආහාර ගන්නා විට අත්ල මුඛයට ඇතුළු කිරීම.
- ආහාර මුඛයෙහි තිබිය දී කථා බහ කිරීම.
- මුඛය විවෘත කොට ඒ තුළට ආහාර විසි කිරීම.
- බත් පිඬ කටින් කඩ කඩා වැළඳීම.
- දිව මුවින් පිටතට ඇද ආහාර ගැනීම.
- වඳුරන් මෙන් හක්කේ තබාගෙන ආහාර අනුභව කිරීම.
- සුරු සුරු හඬ නගමින් ආහාර ගැනීම.
- අත ලෙවකමින් ආහාර ගැනීම.
- පාත්‍රය ලෙවකමින් ආහාර ගැනීම.
- තොල් ලෙවකමින් ආහාර ගැනීම.
- ඉඳුල් සහිත අතින් පැන් බඳුන ගැනීම.
- අතගසා දමමින් ආහාර ගැනීම.

(ලකුණු - 2+3+5 = 10)

07. පහත මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) බෞද්ධ ස්තූපය - 10 ශ්‍රේණියේ බුද්ධ ධර්මය පෙළ පොතෙහි 108 - 109 - 110 පිටු බලන්න.

(ii) සද්ධර්ම රත්නාවලිය - 10 ශ්‍රේණියේ බුද්ධ ධර්මය පෙළ පොතෙහි 121 පිටු බලන්න.

(iii) සප්ත අපරිහානීය ධර්ම - 10 ශ්‍රේණියේ බුද්ධ ධර්මය පෙළ පොතෙහි 126 - 127 පිටු බලන්න.

(iv) වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයාණන් වහන්සේ
10 ශ්‍රේණියේ බුද්ධ ධර්මය පෙළ පොතෙහි 34 - 35 - 36 - 37 පිටු බලන්න.
(එක් මාතෘකාවක් සඳහා ලකුණු 5 බැගින් = 10 )


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න